# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1774/27 - 2012 සැප්තැම්බර් මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2012.09.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී. බී 9/93.

(469 වන අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත

(469 වන අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 71 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 30 වන වගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

එස්. එම්. චන්ද්‍රසේන,
ගොවිජන සේවා හා වනජීවී අමාත්‍ය.

2012 අගෝස්තු මස 29 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2012 අංක 1 දරන මුහුදු ක්ෂීරපායී සතුන් (නිරීක්ෂණ, නියාමන සහ පාලන) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙම නියෝග මගින් ශ්‍රී ලංකාවේ දේශීය ජලතීරය ඇතුළත ස්වාභාවික වාසස්ථාන ඇති සියලු මුහුදු ක්ෂීරපායී සතුන්ගේ සාමකාමී සහ ස්වාභාවික පැවැත්ම හැකිතාක් දුරට සහතික කිරීම සඳහා අදහස් කරනු ලබන අතර, මෙම නියෝග, එකී මුහුදු ක්ෂීරපායී සතුන් නිරීක්ෂණය කිරීමේ කාර්ය සඳහා නරඹන්නන් විසින් භාවිත කරනු ලබන යාත්‍රා නියාමනය කිරීමට සහ පාලනය කිරීමට ද උපකාරී වේ.

3. (1) මුහුදු ක්ෂීරපායී සතුන්ගේ ස්වාභාවික වාසභූමි වලට නරඹන්නන් රැගෙන යාමේ කාර්ය සඳහා යාත්‍රා කරනු ලබන සෑම යාත්‍රාවක්ම භාවිත කරනු ලැබිය යුත්තේ විශේෂයෙන් ම තත් කාර්ය සඳහා (මෙහි මින්මතු "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) වනජීවී සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් හෝ ඒ සඳහා ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකුගෙන් බලපත්‍රයක් ලබා ගැනීමෙන් පසුව ය.

(2) මුහුදු ක්ෂීරපායී සතුන් නිරීක්ෂණය කිරීම සඳහා නරඹන්නන් රැගෙනයාම පිණිස යාත්‍රාවක් යාත්‍රා කිරීම සඳහා තමාට බලය පවරමින් (1) ඡේදයේ නිශ්චිතව සඳහන් කර ඇති පරිදි බලපත්‍රයක් ලබා ගැනීමට අදහස් කරනු ලබන එවැනි යාත්‍රාවක අයිතිකරු හෝ ක්‍රියාකරු වන සෑම තැනැත්තෙක්ම නිශ්චිතව සඳහන් කරනු ලබන ගාස්තුව සමග මෙම නියෝගවල I වන උපලේඛනයේ දක්වා ඇති ආකෘති පත්‍රයට සාරානුකූලව වූ ඉල්ලීමක් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(3) මුහුදු ක්ෂීරපායි සතුන් නිරීක්ෂණය කිරීමට නරඹන්නන් රැගෙන යාමේ කාර්ය සඳහා යාත්‍රා සේවා සැපයීමේ නිරත සෑම යාත්‍රාවක් ම (1) වන ඡේදයේ නිශ්චිතව සඳහන් බලපත්‍රයක් ලබා ගැනීමට පෙර (මෙහි මින්මතු "දෙපාර්තමේන්තුව" යනුවෙන් සඳහන් කරනු ලබන) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙහි ලියාපදිංචි විය යුතු ය. ලියාපදිංචි ගාස්තුව වර්ෂයකට රුපියල් පන්දාහකි.

(4) මෙහි (2) වන ඡේදය ප්‍රකාර ඉල්ලීමක් ඉදිරිපත් කිරීමේ දී, එකී ඉල්ලුම්කරු විසින් එම ඉල්ලීම සමග පහත දැක්වෙන ලේඛන ද ඉදිරිපත් කළ යුතු ය :–

(අ) තත් කාර්ය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරන ලද ආයතනයකින් ලබාගත් එම යාත්‍රාව සම්බන්ධයෙන් වූ යෝග්‍යතා සහතිකයක් ;

(ආ) එම යාත්‍රාවේ සේවක සංඛ්‍යාව සහ එහි රැගෙනයාමට අයිතිය ඇති මගීන් සංඛ්‍යාව ද ආවරණය වන පරිදි අනුමත රක්ෂණ සමාගමකින් ලබාගත් එම යාත්‍රාව සඳහා වූ සම්පූර්ණ රක්ෂණ ආවරණයක් ;

(ඇ) සේවක මණ්ඩලය සහ මගීන් සඳහා එම යාත්‍රාවේ ජීවිත ආරක්ෂක ඇඳුම් සහ ජීවිත බේරාගැනීමේ අත්‍යවශ්‍ය උපකරණ ඇති බවට සාධක ;

(ඈ) එම යාත්‍රාව මුහුදු යන අවස්ථාවේ දී එය තුළ යාත්‍රා ක්‍රියාකරුවෙකු සහ සහය යාත්‍රා ක්‍රියාකරුවෙකු සිටින බවට ඔප්පු කිරීමේ සාක්ෂි.

4. යථා පරිදි සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර ලබා දී ඇති තොරතුරු සහ වෙනත් විස්තර සත්‍යායනය කිරීමෙන් පසු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම යාත්‍රා සම්බන්ධයෙන් මෙම නියෝග ප්‍රකාරව බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය. නැතහොත්, ලබා දී ඇති තොරතුරු හා වෙනත් විස්තර සාවද්‍ය නම්, එවැනි බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කළ යුතු ය. තත් කාර්ය සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන ලේඛනයක එම යාත්‍රාව ලියාපදිංචි කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කටයුතු සැලැස්විය යුතු ය.

---

5. යම් ලියාපදිංචි යාත්‍රාවක් වෙත නිකුත් කරනු ලබන බලපත්‍රය මෙම නියෝගවල II උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ආකෘතියට සාරානුකූලව විය යුතු අතර මුහුදු ක්ෂීරපායි සතුන් නිරීක්ෂණය කිරීමේ කාර්ය නොවන්නා වූ අන් කාර්යයන් සඳහා භාවිත නොකළ යුතු ය. එම බලපත්‍රය සෑම විටම යාත්‍රාවේ රැගෙන යායුතු අතර, හැකි පහසු ප්‍රමාණයට එය ජලයෙන් හෝ සමාන ආකාරයකින් හානියට පත්වනු ලැබීමෙන් වළක්වා ගත යුතු ය.

6. බලපත්‍රයක් නිකුත් කර ඇත්තේ යම් යාත්‍රාවක් සම්බන්ධයෙන් ද එම යාත්‍රාව යාත්‍රා කිරීමට බලය පවරනු ලැබිය යුත්තේ එම තැනැත්තා වෙත නිකුත් කරනු ලබන බලපත්‍රයෙහි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සඳහන් කරනු ලබන කලාපය හෝ කලාප තුළ පමණකි ; නැතහොත් සාමාන්‍යයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කලින් කල නිකුත් කරනු ලබන නිවේදනයක් මගින් සඳහන් කරනු ලබන කලාප හෝ කලාපය තුල පමණි.

7. යම් යාත්‍රාවක් වෙත නිකුත් කරනු ලබන බලපත්‍රයක වලංගු කාලසීමාව එක් ලිත් වර්ෂයක් වේ. යම් වර්ෂයක් සඳහා බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වූ ඉල්ලීමක් ඊට කලින් වර්ෂයේ දෙසැම්බර් මස 15 වන දිනට පෙර ඉදිරිපත් කළ යුතු ය.

8. මුහුදු ක්ෂීරපායි සතුන් නිරීක්ෂණය කිරීම සඳහා වූ යාත්‍රාවක් සම්බන්ධයෙන් වාර්ෂික බලපත්‍රයක් ලබා ගැනීමට නිශ්චිත සඳහන් කාලයක් ඇතුළත ඉල්ලුම් කිරීමට අපොහොසත් වන යම් තැනැත්තෙක්, බලපත්‍රයක් නොමැතිව එම යාත්‍රාව යාත්‍රා කරන සෑම දිනයක් සඳහාම, දිනකට රුපියල් 100/- බැගින් වූ දඩයකට යටත් විය යුතු ය.

9. මුහුදු ක්ෂීරපායි සතුන් නිරීක්ෂණය කිරීමේ කාර්යය සඳහා යාත්‍රාවක් මගින් රැගෙන යන යම් මගියකු අවසරලත් කලාපය හෝ කලාප තුළදී දියෙහි කිමිදී එකී සතුන් නිරීක්ෂණය කිරීමට අදහස් කරන අවස්ථාවක යාත්‍රාවේ ක්‍රියාකරු විසින් ඒ සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පූර්ව අවසරය ලබාගත යුතු ය.

10. මුහුදු ක්ෂීරපායි සතුන් ස්වාභාවික වාසභූමිවල දී නිරීක්ෂණය කිරීම සඳහා මගීන් මුහුදට රැගෙනයාමට පෙර, මුහුදු ක්ෂීරපායි සතුන් ආරක්ෂා කිරීම සඳහා ගතයුතු සංරක්ෂණ වැඩපිළිවෙලේ අවශ්‍යතාවය පිළිබඳව ද මුහුදු ක්ෂීරපායි සතුන් නැරඹීම සඳහා මගීන් මුහුදට රැගෙනයාමේ දී ඔවුන් යටත්වන සීමා කිරීම් සම්බන්ධයෙන් ද එකී මගීන් දැනුවත් කළ යුතු ය.

11. මුහුදු ක්ෂීරපායි සතුන් නිරීක්ෂණය කිරීම සඳහා මගීන් රැගෙනයාමට යාත්‍රාවක් සේවයේ යොදවනු ලබන විටක, අදාළවන සීමා කිරීම් ඇතුළත් මුද්‍රිත ලිපි ලේඛන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කොට බලපත්‍රලත් යාත්‍රා ක්‍රියාකරුවන් වෙත ඒවා ලබා ගැනීමට ඉඩ සැලැස්විය යුතු ය.

12. මුහුදු ක්ෂීරපායී සතුන් නිරීක්ෂණය කිරීම සඳහා මුහුදට රැගෙන යන සෑම යාත්‍රාවක ම ක්‍රියාකරුවකු, සහකාර ක්‍රියාකරුවකු සහ මාර්ගෝපදේශකයකු සිටිය යුතු ය. මාර්ගෝපදේශකයා දෙපාර්තමේන්තුව විසින් පුහුණු කරනු ලැබූ මාර්ගෝපදේශකයකු විය යුතු ය. සියලුම මාර්ගෝපදේශකයන් දෙපාර්තමේන්තුව වෙත ලියාපදිංචි විය යුතු ය.

13. මුහුදු ක්ෂීරපායී සතුන් නැරඹීම සඳහා යාත්‍රාවක නැගී මුහුදු යාමට අදහස් කරන සෑම තැනැත්තෙක් හෝ කණ්ඩායමක් ම තත් කාර්ය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් හෝ එම කාර්ය සඳහා පිටත්ව යන ස්ථානයේ සිටින අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරනු ලැබූ නිලධරයකුගෙන් හෝ අවසර පත්‍රයක් ලබා ගත යුතු ය. එවැනි අවසර පත්‍රයක් ලබා ගැනීමට අපේක්ෂා කරන සෑම තැනැත්තෙක් ම පිටත්ව යන ස්ථානයෙන් ඔහු වෙත ලබා දිය යුතු ආකෘති පත්‍රයක් පිරවීම මගින් IV වන උපලේඛනයේ දක්වා ඇති කාරණා සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් කිරීම නියමිත වන්නේය. එසේ නිකුත් කරනු ලබන අවසර පත්‍රය V උපලේඛනයේ දක්වා ඇති ආකෘති පත්‍රයට අනුකූල විය යුතු ය. V වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුව ගෙවීමේ දී අවසර පත්‍රය නිකුත් කරනු ලැබිය යුතු ය.

14. මුහුදු ක්ෂීරපායී සතුන් නිරීක්ෂණය කිරීමේ කාර්යය සඳහා මේ නියෝග ප්‍රකාර නිකුත් කළ බලපත්‍රයක් නැති වූ හෝ හානියට පත් වූ හෝ අවස්ථාවක, බලපත්‍රය අදාළවන්නා වූ යාත්‍රාවේ අයිතිකරු හෝ ක්‍රියාකරු විසින්, අලුත් බලපත්‍රයක් ඉල්ලා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ය. අලුත් බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා රුපියල් පන් සියයක ගාස්තුවක් ගෙවනු ලැබිය යුතු ය.

## I වන උපලේඛනය

*වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත*

*මුහුදු ක්ෂීරපායී සත්ත්ව විශේෂ නැරඹීම පිණිස යාත්‍රාවක් යොදවීම සඳහා වූ බලපත්‍රය සඳහා වූ ඉල්ලීම*

1. ඉල්ලුම්කරුගේ විස්තරය –

   (i) ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :–
   (ii) ඉල්ලුම්කරුගේ ලිපිනය :–
   (iii) ජා. හැ. අංකය :–
   (iv) දුරකථන අංකය :–
   (v) විද්‍යුත් ලිපිනය :–
   (vi) යාත්‍රාංගනයේ නම :–
   (vii) යාත්‍රාංගනය පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම :–

2. ඉල්ලුම්කරු යාත්‍රාවේ අයිතිකරු නොවේ නම්, අයිතිකරු පිළිබඳ විස්තර –

   (i) අයිතිකරුගේ සම්පූර්ණ නම :–
   (ii) යාත්‍රා අයිතිකරුගේ ලිපිනය :–
   (iii) ජා. හැ. අංකය :–
   (iv) දුරකථන අංකය :–
   (v) විද්‍යුත් ලිපිනය :–
   (vi) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :–

3. යාත්‍රාවේ විස්තර –

   (i) යාත්‍රාවේ ලියාපදිංචි අංකය :–
   (ii) එය ලියාපදිංචි කර ඇති කාර්යාලය :–
   (iii) රක්ෂණ ඔප්පුවේ අංකය :–
   (iv) යාත්‍රාවේ නම :–
   (v) යාත්‍රාව තුළ මගීන් සඳහා ප්‍රමාණවත් ජීවිත රක්ෂණ උපකරණ තිබේ ද යන වග :–
   (vi) එක් චාරිකාවක් සඳහා යාත්‍රාවේ ගමන් කළ හැකි උපරිම මගීන් සංඛ්‍යාව :–
   (vii) යෝග්‍යතා සහතිකය නිකුත් කරන ලද ආයතනයේ නම :–
   (viii) නිකුත් කළ දිනය :–
   (ix) යාත්‍රාංගනය පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :–

4. යාත්‍රාවේ ක්‍රියාකරු පිළිබඳ විස්තර –

   (i) සම්පූර්ණ නම :–
   (ii) ලිපිනය :–
   (iii) ජා. හැ. අංකය :–

5000. ය

5. යාත්‍රාවේ සහකාර ක්‍රියාකරු පිළිබඳ විස්තර –

(i) සම්පූර්ණ නම :–
(ii) ලිපිනය :–
(iii) ජා. හැ. අංකය :–

6. බලපත්‍රය ඉල්ලා සිටිනු ලබන කාලසීමාව
(උපරිම කාලසීමාව එක් ලිත් වර්ෂයක් විය යුතු ය.) 200 ....................................... සිට ................................. දක්වා.

7. ඉල්ලුම්කරුගේ ප්‍රකාශය –

ඉහත සඳහන් විස්තර සත්‍ය හා නිවැරදි බවත්, වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතට සහ මුහුදු ක්ෂීරපායි සතුන් නැරඹීමේ කාර්ය සඳහා සාදන ලද එම නියෝගවලට ද අනුකූලව ක්‍රියා කරන බවත්, මම මෙයින් සහතික කරමි. මුහුදු ක්ෂීරපායි සතුන් නැරඹීම සඳහා යාත්‍රාව මෙහෙයවනු ලබන විට, බලපත්‍රය නිකුත් කර ඇත්තේ යම් කොන්දේසිවලට යටත්ව ද එම කොන්දේසිවලට අනුකූලව ද ක්‍රියා කරමි.

.......................................................
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :–

**II වන උපලේඛනය**

*වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත*

*මුහුදු ක්ෂීරපායි සතුන් නිරීක්ෂණය කිරීම සඳහා යාත්‍රාවක් යාත්‍රා කරවීම සඳහා වූ බලපත්‍රය*

බලපත්‍ර අංකය :–
යාත්‍රාවේ නම :–
යාත්‍රාවේ අංකය :–

..................................................... කලාපය/කලාප ඇතුළත ........................... සිට ................................ දක්වා කවර හෝ දිනක දී පෙ.ව. 5.30 සිට පස්වරු 7.00 දක්වා කාලය තුළ මුහුදු ක්ෂීරපායි සතුන් නිරීක්ෂණය කිරීම පිණිස පුද්ගලයන් රැගෙන යාමේ කාර්ය සඳහා ....................................... පදිංචි ....................................... ට අයත් ලියාපදිංචි අංක ....................................... දරන යාත්‍රාව ධාවනය කිරීම සඳහා (මෙහි මින්මතු "බලපත්‍රලාභියා" යනුවෙන් සඳහන් කරනු ලබන) ....................................................... පදිංචි ............................... මහතාට/මහත්මියට මෙයින් බලය පවරනු ලැබේ. එම යාත්‍රාව ....................................................................................... යාත්‍රාංගනයේ රඳවා තැබිය හැකි ය.

............................................... පදිංචි ............................................... මහතා මෙම යාත්‍රාවේ ක්‍රියාකරු වන අතර ................................... පදිංචි ......................................... මහතා මෙම යාත්‍රාවේ සහකාර ක්‍රියාකරු වේ.

(යාත්‍රාව මුහුදේ ධාවනය කරන විට මෙම බලපත්‍රය බලපත්‍රලාභියා හෝ ක්‍රියාකරු හෝ වෙත තබාගත යුතු ය. මෙම බලපත්‍රය අන්සතු කළ නොහැක.)

අධ්‍යක්ෂ ජනරාල් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
බලයලත් නිලධාරී.

දිනය :–

## III වන උපලේඛනය

බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ යම් කොන්දේසිවලට යටත්ව ද එම කොන්දේසි පහත දැක්වේ –

1. යාත්‍රාව අයිතිකරු හෝ ක්‍රියාකරු වෙත නිකුත් කරන ලද බලපත්‍රය අන්සතු කළ නොහැක.
2. යාත්‍රාව යම් නිශ්චිත යාත්‍රාංගනයක සිට ගමන ආරම්භ කළ යුතු අතර එම යාත්‍රාංගනයටම ආපසු පැමිණිය යුතු ය.
3. සෑම යාත්‍රාවක් ම මීටර් 50ක් දුර සිට එම යාත්‍රාවේ අංකය නිරීක්ෂණය කළ හැකි පරිදි එම අංකය යාත්‍රාවේ ලියා තිබිය යුතු ය.
4. මුහුදු ක්ෂීරපායි සතුන් නිරීක්ෂණය කිරීම සඳහා දිනපතා පෙ.ව. 5.30 සිට ප.ව. 7.00 දක්වා අවසර දෙනු ලැබේ.
5. මුහුදු ක්ෂීරපායි සතුන් දර්ශනය වූ විට, එහි සිට යාත්‍රාවට ඇති දුර ප්‍රමාණය මීටර් 400 වන තෙක් යාත්‍රාවේ වේගය ක්‍රමක්‍රමයෙන් අඩුකල යුතු ය. තල්මසුන් සම්බන්ධයෙන් වන විට තල්මසුන් සිටින ස්ථානයේ සිට මීටර් 100ක් දුරින් යාත්‍රාව නවතා එහි ඇන්ජිම ක්‍රියා විරහිත කළ යුතු ය. කිසිදු අවස්ථාවක තල්මසුන් සිටින ස්ථානයේ සිට යාත්‍රාවට ඇති දුර මීටර් 100කට වඩා ආසන්න නොවිය යුතු ය. වෙනත් ක්ෂීරපායී සතුන් සම්බන්ධයෙන් එම සතුන් සිටින ස්ථානයේ සිට මීටර් 50කට වඩා අඩු දුර ප්‍රමාණයකට යාත්‍රාව ලඟා නොවිය යුතු ය.
6. යාත්‍රාව ස්වකීය වේගය හෝ දිසාව හිටිහැටියේ වෙනස් නොකළ යුතු ය. ක්ෂීරපායී සතුන් නිරීක්ෂණය කරන විට එම සතුන්ගේ ඉදිරියෙන් හෝ පිටුපසින් යාත්‍රා ගමන් නොකළ යුතු අතර එම සතුන්ගේ ගමන් මාර්ගය අවහිර වන පරිදි කිසිදු අවස්ථාවක යාත්‍රාව ගමන් නොකරන බවට වග බලාගත යුතු ය.
7. මුහුදු ක්ෂීරපායි සතුන් යාත්‍රාව කෙරෙහි අද්දා ගැනීම සඳහා හෝ ඔවුන් ඒ ආසන්නයට ගෙන්වා ගැනීමට පෙළඹවීම සඳහා එම සතුන් සඳහා කිසිදු කෘත්‍රිම ආහාර ද්‍රව්‍යයක් ලබා දීම හෝ ආලෝක සහ ශබ්ද තරංග සහ සතුන් ආකර්ශනය කිරීමේ වෙනත් ක්‍රමයක් හෝ භාවිතා නොකළ යුතු ය.
8. මුහුදු ක්ෂීරපායි සතුන් නිරීක්ෂණය කිරීම සඳහා මගීන් රැගෙන යන යාත්‍රාවක් තුළ සෑම විට ම ලියාපදිංචි මාර්ගෝපදේශයකු සිටිය යුතු ය.
9. යාත්‍රාව ක්‍රියා කරවන තැනැත්තන් හෝ යාත්‍රාවේ මගීන් යාත්‍රාව තුල මත්පැන් රැගෙන නොයා යුතු ය. එසේම යාත්‍රාවට නගින අවස්ථාවේ එකී කවර හෝ තැනැත්තකු මත්පැන් පානය කොට නොතිබිය යුතු ය.
10. ඉහත කී කොන්දේසි වලට අමතරව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කලින් කළ සඳහන් කරනු ලබන වෙනත් කොන්දේසිවලට ද බලපත්‍රලාභියා යටත් වන්නේය.
11. යාත්‍රාවේ ක්‍රියාකරුවන් හෝ මාර්ගෝපදේශකයන් හෝ මුහුදු ක්ෂීරපායි සතුන් නිරීක්ෂණය කිරීම සඳහා මගීන් රැගෙන යන තැනැත්තන් හෝ මෙම නියෝගවල විධිවිධාන උල්ලංඝනය වන ආකාරයට ක්‍රියා නොකල යුතු ය.
12. මුහුදු ක්ෂීරපායි සතුන් නැරඹීමේ යෙදී සිටින තැනැත්තන්ට අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් පසු, කිමිදීම හැර, මුහුදට බැසීමට හෝ එකී ක්ෂීරපායී සතුන්ට හානි කරන වෙනත් දෙයක් සිදු කිරීමට හෝ ඉඩ නොදිය යුතු ය.
13. මුහුදු ක්ෂීරපායි සතුන් නැරඹීම සඳහා මුහුදට යන විට ධීවර කර්මාන්තයේ නියැලී සිටින තැනැත්තන්ට බාධා නොකල යුතු ය.
14. යාත්‍රාවේ සිටින තැනැත්තන්ට ගොඩබිම සමග සම්බන්ධතා පැවැත්විය හැකි පරිදි යාත්‍රාව තුළ සංනිවේදන උපකරණ තිබිය යුතු අතර යාත්‍රාවේ ජී.පී.එස්. උපකරණය තිබිය යුතු ය.
15. යාත්‍රාවේ යම් කාර්මික දෝෂයක් ඇති වුවහොත් හෝ යාත්‍රාවට වෙනත් හදිසි තත්ත්වයකට මුහුණ දීමට සිදු වුවහොත් එම කාරණා කරුණු සංනිවේදන උපකරණ හරහා ගොඩබිමේ ඇති යාත්‍රාංගනය වෙත හෝ ශ්‍රී ලංකා නාවුක හමුදාවට / ශ්‍රී ලංකා පොලීසියට දැනුම් දිය යුතු ය.
16. අයහපත් කාලගුණය පවතින විට මුහුදු ක්ෂීරපායි සතුන් නිරීක්ෂණය කිරීම සඳහා යාත්‍රාව මුහුදට නොයා යුතු ය. අයහපත් කාලගුණික තත්ත්වයන් පවත්නා විට යාත්‍රාව වහාම ගොඩබිම කරා පැමිණිය යුතු ය.
17. වනජීවී නිලධරයෙකුහට හෝ බලයලත් නිලධරයෙකුහට යම් අවස්ථාවක යාත්‍රාව පරීක්ෂා කිරීමට අවශ්‍ය නම් කිසිදු විරෝධතාවයකින් තොරව එසේ කිරීමට අවකාශ දිය යුතු ය.
18. ඉහත සඳහන් කොන්දේසි වලින් එකක් හෝ කීපයක් හෝ සියල්ලම හෝ කඩ කරනු ලැබුවහොත් එමගින් යාත්‍රාවේ බලපත්‍රය අවලංගු කිරීමේ ප්‍රතිඵලය ඇතිවිය හැකි ය.

## IV වන උපලේඛනය

### වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත

මුහුදු ක්ෂීරපායි සත්ත්ව විශේෂ නැරඹීම සඳහා අවසර පත්‍රයක් ලබා ගැනීම පිණිස දැනුම් දිය යුතු විස්තර –

1. ඉල්ලුම්කරු පිළිබඳ විස්තර –

   (i) ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :–
   (ii) ඉල්ලුම්කරුගේ ලිපිනය :–
   (iii) ජා. හැ. අංකය :–
   (iv) දුරකථන අංකය :–
   (v) විද්‍යුත් ලිපිනය :–

2. අවසර පත්‍රය මගින් ඉල්ලුම් කරනු ලබන මුහුදු කලාපය :–

3. යාත්‍රාංගනය /වරාය :–

4. යාත්‍රාංගනය/වරාය පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :–

5. මුහුදු ක්ෂීරපායි සත්ත්ව විශේෂ නැරඹීමට යන දිනය :–

6. ඉල්ලුම්කරු සමග ගමන් කරන මගීන්ගේ සංඛ්‍යාව (ඉල්ලුම්කරු ඇතුළුව) :–

7. මුහුදු ක්ෂීරපායි සතුන් නිරීක්ෂණය සඳහා භාවිතා කරනු ලබන යාත්‍රාවේ ලියාපදිංචි අංකය :–

8. යාත්‍රාවේ නම :–

ඉහත නිශ්චිතව සඳහන් දිනයේ දී මුහුදු ක්ෂීරපායි සත්ත්ව විශේෂ නැරඹීමේ කාර්ය සඳහා මා වෙත/අප කණ්ඩායම වෙත අවසර පත්‍රයක් නිකුත් කරන ලෙස ඉල්ලා සිටිමි./සිටිමු. අවසර පත්‍රය මගින් පනවා ඇති කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කිරීමට මම එකග වෙමි. /අප කණ්ඩායම එකග වේ.

දිනය :–

.............................................................
ඉල්ලුම්කරුගේ අත්සන.

## V වන උපලේඛනය

### වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත

මුහුදු ක්ෂීරපායි සතුන් නිරීක්ෂණය කිරීමේ කාර්ය සඳහා නිකුත් කරනු ලබන අවසර පත්‍රය

.......................................... දින පෙ.ව. 5.30 සිට ප.ව. 7.00 දක්වා කාලය තුළ .......................................... කලාපයේ බලපත්‍ර අංක .................... දරන යාත්‍රාව භාවිත කරමින් මුහුදු ක්ෂීරපායී සතුන් නිරීක්ෂණය කිරීම සඳහා .......................................... පදිංචි .......................................... මහතා/මහත්මියට හා/හෝ පුද්ගලයන් .......................................... සමන්විත ඔබේ කණ්ඩායමට මෙයින් බලය පවරනු ලැබේ.

#### කොන්දේසි

(i) මුහුදු ක්ෂීරපායි සතුන් නිරීක්ෂණය කිරීමේ කාර්ය සඳහා, අවසර පත්‍ර දරන්නා/දරන්නන් විසින්, අවසර ලබා දී ඇති මුහුදු කලාපය පමණක් භාවිත කළ යුතු ය.

(ii) අවසර ලබා දී ඇති යාත්‍රාව තුළ අවසර ලබා නොමැති තැනැත්තන් රැගෙන නොයා යුතු ය.

(iii) ක්ෂීරපායි සතුන් නැරඹීම දිනයේ නියමිත වේලාවන් තුළ පමණක් සිදු කළ යුතු ය.

(iv) ක්ෂීරපායි සතුන් නරඹන අතරතුර එම සතුන්ගේ ස්වාභාවික පැවැත්මට අහිතකර කිසිදු දෙයක් නොකළ යුතු ය.

(v) ක්ෂීරපායි සතුන් නරඹන අතරතුර මුහුදට ආහාර ද්‍රව්‍ය විසි කිරීම නොකළ යුතු ය.

(vi) මෙම අවසර පත්‍රය අන්සතු කළ නොහැක.

(vii) අවසර පත්‍ර දරන්නා/දරන්නන් වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත යටතේ පනවන ලද රීති/නියෝග සහ කොන්දේසිවලට යටත් විය යුතු ය.

ගාස්තු

| I තීරය<br>පුද්ගලයන් පිළිබඳ විස්තර | II වන තීරය<br>ගාස්තු |
|---|---|
| 1. වැඩිහිටි (දේශීය) | රු.20.00 |
| 2. වැඩිහිටි (විදේශීය) | ඇ.ඩො.8ක් හෝ ඊට සමාන මුදල ශ්‍රී ලංකා රුපියල් වලින් |
| 3. ළමුන් දේශීය (වයස අවුරුදු 6-12 අතර) | රු.10.00 |
| 4. ළමුන් විදේශීය (වයස අවුරුදු 6-12 අතර) | ඇ.ඩො. 4ක් හෝ ඊට සමාන මුදල ශ්‍රී ලංකා රුපියල් වලින් |
| 5. පාසැල් ළමුන් (එක් අයෙකු සඳහා) | රු.5.00 |

09-603

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.